**රාජ්‍ය මුද්‍රණ සංස්ථාව - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව මුළුමනින්ම අගය ශුන්‍ය වූ එහෙත් තවදුරටත් භාවිතා කරන එකතුව රු. 64,281,974 ක් වටිනා දේපළ පිරියත උපකරණ අයිතම 352 ක ඵලදායී ජීවිත කාලය නැවත අගය කර පොත්වලට ගෙන නොතිබුණි. | සංස්ථාවේ පවත්නා මූල්‍ය අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරවාගැනිමට ප්‍රතිපාදන සැකසීම ඉතා දුෂ්කර කාරණයක් විය. කෙසේ වෙතත් සංස්ථා ගිණුම් ප්‍රකාශණ මෙම වසරේ සිට ඉදිරියට සැකසීමට කටයුතු කරනු ලැබේ. | අදාල ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට ලබා දි තිබූ රු.27,951,780 ක විකුණුම් අත්තිකාරම් මුදලක්, ණයගැති ලැබීමක් ලෙස සටහන් කර තිබීම නිසා සංස්ථාවේ ජංගම වත්කම් හා ජංගම වගකීම් එම | 2023 වසරේ ගිණුම් වලින් මේ වන විටත් නිවැරදි කර ඇත. ඉදිරියේදී එසේ ලැබෙන මුදල් විකුණුම් අත්තිකාරම් ලෙස ගිණුම් ගත කිරිමට කටයුතු සංවිධානය කර ඇත. | ගණුදෙනුවක ද්විත්ව සටහන නිවැරදිව හදුනා ගෙන ගිණුම් තැබිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ii). | 2021 වර්ෂයේ ජාතික ලොතැරැයි මණ්ඩලය සමඟ ලොතැරැයි පතක් මුද්‍රණය කර දිම සඳහා ගිවිසුම් ගත මුදල වු ශත 49 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් ශත 44 දක්වා අඩුකිරිමට එකඟවිම නිසා සංස්ථාවට සිදු වු රු.10,519,265 ක අලාභය අඩමාණ ණය වෙන් කිරිමක් ලෙස ගලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අලාභය ණය ගැතියන්ගෙන් අඩුකර පෙර වර්ෂයේ ගැලපුමක් ලෙස රඳවාගත් ලාභයෙන් අඩුකර දක්වා තිබුණි. ඒ අනුව රඳවාගත් අලාභය සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රමාණයේන් තවදුරටත් වැඩි වී තිබු අතර, සමාලෝචිත වර්ෂයේ අඩමාණ ණය වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම්වලින් එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිසි අධිකාරි බලය යටතේ කටයුතු කල යුතු අතර ගිණුම් තැබිමේදි එම සටහන් වල නිවැරදි හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය. |
| (iii). | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුව සඳහා ගණනය කරන ලද පොළිය රු.491,369 කින් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේදී මාස 06 කට අදාළව අපේක්ෂිත බැංකු පොළිය ගිණුම් ගත කර තිබුණි, නමුත් එය මාස 07 ක් විය යුතු අතර මාසයකට අදාල පොලිය අඩුවෙන් ගිණුම්ගත කර ඇත. | අදාල කාලපරිච්ඡේය නිසියාකාරව හඳුනාගෙන ගිණුම් සටහන් පිළියෙල කල යුතුය. |
| (iv). | විකුණුම් පිරිවැය ගණනය කිරීම් සඳහා අදාල නොවන මෙහෙයුම් වියදමක් පදනම් කරගෙන විකුණුම් පිරිවැය ගණනය කිරීම හේතුවෙන් විකුණුම් පිරිවැය රු.20,468,587 කින් අධිතක්සේරු වී ආදායම් ප්‍රකාශනයේ දළ අලාභයක් නිරූපනය වී තිබුණි. | ප්‍රමාද දෝෂයකින් මෙය විකුණුම් පිරිවැයට එකතු වී ඇතත් එය මෙහෙයුම් පිරිවැයක් ලෙස සටහන් කළ යුතුව තිබුණි . | මූල්‍ය ප්‍රකාශන තුල නිසි වර්ගීකරණයන් යටතේ අයිතමයන් ඇතුළත් කල යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i). අය විය යුතු ශේෂ | 3,210,565 | - | 3,210,565 | නිවැරදිතාවය නැවත තහවුරු කරගෙන වාර්තා කිරීමට කටයුතු කරමි. | අදාල ආයතන සමඟ සම්බන්ධ වී ශේෂ කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කළ යුතුය. |
| (ii). ගෙවිය යුතු ශේෂ | 166,509,372 | 172,728,682 | 6,219,310 | නිවැරදිතාවය නැවත තහවුරු කරගෙන වාර්තා කිරීමට කටයුතු කරමි. | අදාල ආයතන සමඟ සම්බන්ධ වී ශේෂ කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගණුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | මහජන බැංකුව විසින් ලබාදුන් අනුමත බැංකු අයිරා සිමාව රු.40,000,000 වු අතර 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු අයිරාව රු.41,090,093 ක් විම හේතුවෙන් අනුමත සිමාව ඉක්මවා රු.1,090,093 ණය ලබාගෙන තිබුණි. | මෙය තාවකිලිකව අයිරාව ඉක්මවා ගියද ඒ සඳහා මුදල් තැන්පත් කළ විගස බැංකුව විසින්ම අයකර ගනී. එය බැංකුවේ පොළී අයකිරීමේ ගණුදෙණුව සඳහා පමණක් සීමාව ඉක්මවා යනු ඇත. | අනුමත අයිරා සීමාව තුළ ගණුදෙනු කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 කරුණු අවධාරණය කිරීම

| | විගණන නිරික්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 2.3 කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාලෝචිත වර්ෂය අවසානයේ ශුද්ධ වත්කම් රු.446,712,212 ක ඍණ අගයක් පෙන්වන අතර 2022 ජනවාරි 01 දිනට | පිළිතුරු ලබා දී නොමැත. | සංස්ථාවේ මූල්‍ය තත්ත්වය යහපත් කර ගැනිමට කටයුතු කල යුතුය. |

රු.931,669,314 ක් වූ රඳවාගත් ආදායම් සෘණ ශේෂය සමාලෝචිත වර්ෂයේ අලාභය රු.380,702,801 ක් සහ වර්ෂය තුළදී සිදුකරන ලද පෙර වර්ෂ ගැලපුම් සිදුකිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,163,063,864 ක සෘණ වටිනාකමක් දක්වා පිරිහී තිබුණි. තවද 2021 වර්ෂයේ රු.715,004,435 ක් වූ සෘණ කාරක ප්‍රග්ධන තත්ත්වය සමාලෝචිත වර්ෂයේ දී රු.1,087,098,816 දක්වා තවදුරටත් පිරිහී තිබුණි.

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාවේ සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී 2019 හා ඊට පෙර වර්ෂයන් වලට අදාල ණයගැති ශේෂය රු.176,740,812 ක් විය. සංස්ථාව සමාලෝචිත වර්ෂයේදි මෙම ණය මුදලින් රු.1,252,517 ක් පමණක් නිරවුල් කර ඇති අතර එය 2019 හා ඊට පෙර වර්ෂ වල ණය ශේෂයන්ගෙන් සියයට 0.7ක ප්‍රමාණයක් විය. | මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට ඇති අපහසුතාවය හේතුවෙන් මෙම ණය ගැති ශේෂයන් නිරවුල් කිරීම ඉතා අපහසු වේ. මෙලෙස අයකර ගැනීමට අපහසු ණයගැති ශේෂයන් තෝරාගෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ Pe/01/2021(i) චක්‍රලේඛයේ උපදෙස් අනුව ගිණුම් වලින් ලියා හැරීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගනු ලැබේ. | හිඟ ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2021 නොවැම්බර් මස 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රාහයේ 3.3 පරිච්ඡේදය | සංයුක්ත සැලැස්මේ අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි මානව සම්පත් සැලැස්මක් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | 2021 නොවැම්බර් මස 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රාහයේ 3.3 පරිච්ඡේදයේ සඳහන් |

| | | |
|---|---|---|
| | | පරිදි කටයුතු කළයුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් මහජන බැංකුවේ නුගේගොඩ ශාඛාවේ තැන්පත් කර තිබූ රු.25,000,000 ක ස්ථාවර තැන්පතුව කල්පිරිමට දින 27කට පෙර නැවත ඉහල පොලි අනුපාතයක් යටතේ අලුත් කිරිමට කටයුතු කර තිබුනද එම දින 27ට අදාලව රු.177,183 ක පොළි ආදායමක් අහිමිකරගෙන තිබුණි. | ස්ථාවර තැන්පතුව ඇපයට තබා කෙටිකාලීණ ණය මුදලක් ලබාගැනිමට වූ නිසා එය යළි දිර්ඝ කර ගැනීමට අවශ්‍ය විය. එම නිසා මෙම පාඩුව සිදු විය. | සංස්ථාවේ ආයෝජන තිරණ ගැනිමේදි ආයෝජන ඇගයිම් කර විචක්ෂණව තිරණ ගත යුතුය. |

## 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | 2020 වර්ෂයේ සිට ශේෂයන් වෙනස් විමකින් තොරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු ශේෂය රු.109,467,898 වන අතර එය සමාලෝචිත වර්ෂය වන විටද නිරවුල් කිරිමට කටයුත කර නොතිබුණි. | දේශිය ආදායම් දෙපාර්මේන්තුව වෙත ගෙවීමට ඇති බදු මුදල් සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් මස සාකච්ජාවක් පැවැත්වූ අතර ඒ අනුව වැට් බදු ගෙවීමට සැලසුමක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව පවතින මූල්‍ය තත්වය මත කොටස් වශයෙන් ගෙවීම් කරමින් පවතී තවද පෙර වර්ෂ වලදී හිග ESC,NBT ආදී බදු ශේෂයන් කපා හැරීම සම්බන්ධව දේශිය ආදායම් දෙපාර්මේන්තුව සමග සාකච්ජා කරමින් පවතින අතර ඉන් කොටසක් කපා හැරීමට ඔවුන් එකග වී ඇත. එම වාර්ථා ලද විගස එම ශේෂයන් සංස්ථා ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව දැන්වා සිටිමු. | මෙම බදු ශේෂයන් කඩිනමින් නිරවුල් කර ගැනිමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii). | සමාලෝචිත වර්ෂයේ එකතුකළ අගය මත බදු වගකීම රු.26,641,688 ක් වන අතර එය නිරවුල් කිරිමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | අධ්‍යාපන ප්‍රකාශණ දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරියේදී මුදල් ලැබීමට නියමිත අතර එම මුදල් ලද පසු සියලුම වැට්බදු මුදල් ගෙවීමට කටයුතු කරන්නෙමු. වර්තමානයේ උපයන ලාභය පෙර වර්ෂ වලට අදාලව හිග ණය මුදල් ගෙවීමට සිදුවීම නිසා මූල්‍යමය ගැටළුවක් පවතී .නිරවුල් කිරීමට කටයුතු සැලසුම් කර ඇත. | මෙම බදු ශේෂයන් කඩිනමින් නිරවුල් කර ගැනිමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.380,702,801 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.281,957,906 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.98,744,895 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සංස්ථාවේ මුද්‍රණ ආදායම රු.808,511,204 කින් අඩුවීම සහ මූල්‍ය වියදම් රු.80,206,506 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සංස්ථාවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පෙළපොත් මුද්‍රණ ආදායම් සමාලෝචිත වර්ෂයේදි රු.41,569,625 වු අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පෙළපොත් මුද්‍රණ ආදායම් රු.1,186,918,385 ක් විය. ඒ අනුව ප්‍රධාන ආදායම් ඉපයීම රු.1,145,348,760 කින් පසුබැස ඇති අතර එය ප්‍රතිශතකව සියයට 96 පසුබැසිමකි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

2021 වර්ෂයේදී පිළිවෙලින් 0.6 : 1 ක් හා 0.4 : 1 ක් වු ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 0.28 : 1 ක් හා 0.16 : 1 ක් දක්වා පිරිහී තිබුණි. එසේම 2021 වර්ෂයේදී පිළිවෙලින් සියයට 9.78 ක් සහ සියයට (12.7) ක් වු දල ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට (4.73) ක් හා සියයට (46) ක් දක්වා පිරිහී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව හුදු ලිපියකින් පමණක් සංස්ථාවේ සභාපතිවරයා විසින් මුද්‍රණය කරනු ලබන එක් ලොතරැයි පතකින් සංස්ථාවට ලැබීමට නියමිත මුදල ශත 49 සිට ශත 44 දක්වා අඩු කිරීම නිසා | 2020 සහ 2021 වසරවලදී සංස්ථාවේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අදාල අඩු කිරීම් සිදු කර ඇත. නමුත් එසේ අහිමිවූ ආදායම නැවත ලබා ගැනීම සඳහා පසුව | නිසි නිතීමය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් මෙම මුදල් නැවත අයකර ගැනිමට කටයුතු කඩිනමින් කල යුතුය. ඉදිරියේදි මෙවැනි සිදුවීම් නොවිමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ව්‍යුහය ශක්තිමත් කලයුතුය. |

| | | |
|---|---|---|
| 2021 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.11,899,603 හා රු.7,228,985 ක් ලෙස එකතුව රු.19,128,588 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි. | ලිඛිතව දන්වා ඇති නමුත් එය ගෙවීමට කටයුතු නොකරන ලදී. | |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | සමාලෝචිත වර්ෂයට පෙර සංස්ථාවට අයත් අලෙවිසැල් පහක් වසා දමා ඇති අතර එම අලෙවිසැල් වලින් ගණුදෙනු කල රු.37,199,768 වටිනා ණයගැති ශේෂයන් සමාලෝචිත වර්ෂය ආරම්භයේ නිරූපනය වූ අතර ඉන් සමාලෝචිත වර්ෂයේදි නිරවුල් කර ගෙන ඇත්තේ රු.670,173 ප්‍රමාණයකි. එය අය වීමට ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 1.8 ප්‍රමාණයකි. | මෙම ණය ශේෂයන්ගේන් රු.32,961,638 ක මුදලක් සංසරාජ මාවත අලෙවිසැලට අදාලව හිග හිටි ණය සඳහා ඉන් කොටසක් විගණන අංශය විසින් පරීක්ෂණ සිදු කර වංචාවක් සම්බන්ධව රු.මිලියන 2 කට ආසන්න මුදලක් පැමිණිලි සිදු කිරීමට කටයුතු කර ඇත .ඉතිරිය තොරතුරුවල තත්වය පදනම් කර ගෙන කපා හැරීම හෝ අයකර ගැනීමට කටයුතු කරමි. | මෙම ණයගනුදෙනු සිදු කිරීමට මුලික වූ නිලධාරින් හා අයකරගැනිමට වගකීම පැවරි ඇති නිලධාරින් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා වගකීම පැහැර හැර ඇති නිලධාරින්ගෙන් අදාල මුදල් අය කරගැනිමටත්, අය කරගත හැකි ණයගැතියන්ගෙන් මුදල් කඩිනමින් අය කර ගැනිමටත් කටයුතු කල යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ මූලික ආදායම් ප්‍රභවයක් ලෙස ජාතික ලොතැරැයි මණ්ඩලයේ ලොතැරැයිපත් මුද්‍රණය තුලින් ලැබෙන ආදායම හඳුනාගත හැකි අතර සමාලෝචිත වර්ෂයේ එහි දායකත්වය රු.405,863,648 කි. නමුත් සමාලෝචිත වර්ෂයේ ජාතික ලොතැරැයි මණ්ඩලය දඩ හා ප්‍රමාද ගාස්තු ලෙස රු.20,072,300 අයකර ගෙන තිබුණි. එම දඩ හා ප්‍රමාද ගාස්තු ප්‍රමාණය මුළු ලොතරැයි ආදායමින් සියයට පහක | රටතුල පැවති අයහපත් ආර්ථික වාතාවරණය නිසා අමුද්‍රව්‍ය සපයාගැනිම ගැටළුකාරි වූ නිසා මෙම ප්‍රමාදය ඇති වූ අතර ඒ තුළින් ප්‍රමාද ගාස්තු වැඩි වී ඇත. එම තත්ත්වය වැලැක්වීම සඳහා වර්තමානයේ ක්‍රියාමාර්ග ගෙන ඇත .<br>ජාතික ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි සංස්ථාවට ලබාදුන් මෙගා පවර් ලොතරැයිය 2023 ජනවාරි මස සිට වෙනත් මුද්‍රණ කරුවෙකු | දඩ හා ප්‍රමාදයන් වලක්වා ගැනිමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතු අතර. තම ආදායම් මූලාශ්‍ර කිහිපයක් මත රඳා නොපැවතී ආදායම් මූලාශ්‍ර විවිධාංගිකරණය කල යුතුය. |

| | | |
|---|---|---|
| | ප්‍රමාණයකි. තවද සමාලෝචිත වර්ෂයේදි සංස්ථාව මුද්‍රණය කරන ජාතික ලොතැරැයි මණ්ඩලයේ ලොතරැයිපත් දෙකෙන් එක් ලොතරැයිපතක් සංස්ථාවෙන් ඉවත් කර වෙනත් ආයතයනයකට ලබා දී ඇති බවට නිරීක්ෂණය විය. | වෙත ඔවුන්ගේ තීරණයන්ට අනුව ඉවත් කර ගෙන ඇත. එය ටෙන්ඩර් ක්‍රමය මත ලබා නොගත් බැවින් ඔවුන්ගේ තීරණයට අනුව එකග වීමට සංස්ථාවට සිදුවිය. එනමුද එය ඉවත් කිරීම නතර කිරීමට අප විසින් ජාතික ලොතරැයි මණ්ඩලයට සමග සාකච්ජා කළද ඒවා අසාර්ථක විය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්‍රණ සංස්ථාවේ නිලධාරින් 25 දෙනකු 2000 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා විවිධ වර්ෂ වලදී වැඩ බැලීමේ තනතුරු සඳහා පත් කර ඇත. තවද, එම නිළධාරීන් අතරින් නිළධාරීන් 23ක් තම නිත්‍ය තනතුරේ රාජකාරි වැඩ වලට අමතරව 2021 සිට 2022 වර්ෂය දක්වා වැඩ බලන නිළධාරීන් ලෙස කටයුතු කර එම කාලය සඳහා රු. 1,545,611 ක දීමනාවක් ලබාගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13.3 පරිදි වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. ඒ අනුව තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම නොපමවා කළ යුතුය. |
| (ii). | සංස්ථාවේ ප්‍රාථමික සේවකයින් ගණයට අයත් නුපුහුණු කම්කරුවන් 138 ක් සඳහා අනුමැතිය තිබුණද, අනුමත නොවන මුද්‍රණ සහයක සහ කණිෂ්ඨ නිශ්පාදන සේවකයින් 202 ක් ස්ථිර සේවකයින් ලෙස බඳවා ගැනීම නිසා සමස්ථ අතිරික්ත සේවක සංඛ්‍යාව 64ක් සිටින බව නිරීක්ෂණය විය. මෙම අතිරික්ත සේවකයින් සඳහා 2021 සහ 2022 වර්ෂ වලදී රු.94,158,837 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | මානව සම්පත් සැලැස්මක් පිළියෙල කළ යුතු අතර ඒ අනුව අවශ්‍ය සේවකයින් ගණන අනුමත කරගෙන ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii). | සංස්ථාවේ ප්‍රධාන තනතුරු පහක් වන සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මානව සම්පත් කලමනාකරු, මූල්‍ය කළමනාකරු සහ අලෙවි කළමනාකරු යන තනතුරු 2022 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩු ලෙස පැවති අතර මානවසම්පත් කලමනාකරු සහ මූල්‍ය කළමනාකරු යන තනතුරු සඳහා වැඩබලන නිළධාරීන් පත්කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13.3 පරිදි වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. ඒ අනුව තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම නොපමවා කළ යුතුය. |